12th Academic Sessions
University of Ruhuna, Matara, Sri Lanka ISSN 2362-0412

# ස්ත්‍රී පුරුෂ විදේශ සංක්‍රමණය මගින් සමාජයට සිදුව ඇති බලපෑම (කරන්දෙනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින්)

කුමුදු විශාඛා වීරසිංහ [a] සහ ආර්.එස්.පී. රණබාහු [b]
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

[a] kuweerasinghe@gmail.com [b] shyama.ranabahu@gmail.com

## සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ විදේශ ශ්‍රම සංක්‍රමණයේ කාලීන හා ක්ෂේත්‍රීය පැතිකඩ හඳුනා ගැනීමේදී ස්ත්‍රී පුරුෂ විදේශ ශ්‍රම සැපයුම ගතික ස්වභාවයකින් ක්‍රියාත්මක වෙමින් පවතී. 2012 විදේශ සේවා නියුක්ති කාර්යාංශ වාර්තාවලට අනුව විදේශගත පුරුෂ ශ්‍රමික ප්‍රතිශතය 50.94 හා ස්ත්‍රී ප්‍රතිශතය 49.07 වේ. මෙම තත්ත්වය වර්තමානයේ කාලීන ගැටලුවක් බවට පත්ව ඇති අතරම නිරතුරුවම සාකච්ජාවට බඳුන්වන මාතෘකාවක් බවට පත්ව ඇත. මෙම සංක්‍රමණ ධාරාවන් දෙක හරහා සමාජයට වන බලපෑම කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරින් විමසා බලන ලද අතරම එම ප්‍රදේශයේ පුද්ගලයන්ට විදේශ ශ්‍රම සංක්‍රමණය හරහා පත්ව ඇති ගැටලු වැඩි දුරටත් සාකච්ජා කිරීමක් මෙම පර්යේෂණය මගින් සිදු කරන ලදී. මෙම අධ්‍යයනයේ අධ්‍යයන ගැටලුවක් ලෙස විදේශ ශ්‍රම සංක්‍රමණය සමාජය වෙත බලපෑමක් සිදුකර තිබේද යන්න අධ්‍යයනය කරන ලදී.ප්‍රධාන වශයෙන්ම පුද්ගලාලම්භන අදහස් විමසීමක් සිදු කළ බැවින් ගැඹුරු සාකච්ජා (In depth Interviews) ක්‍රමය අධ්‍යයන ක්‍රමවේදය යටතට යොදා ගන්නා ලදී. සමාජීය බලපෑම විමසීමේදී හඳුනාගත් අදහස්වලින් පැහැදිලි වූයේ මව විදේශගත වූ පවුල්වල පියාගේ බීමත්කම හා නොසැලකිලිමත් බව නිසා සමාජීය ගැටලු රාශියක් හටගෙන ඇති බවයි.

*ප්‍රමුඛ පද: විදේශ ශ්‍රම සංක්‍රමණය, ස්ත්‍රී සංක්‍රමණිකයා, පුරුෂ සංක්‍රමණිකයා, සමාජය, බලපෑම.*